**පස්සර ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 27 වන දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 20 දිනද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 24 දිනද, සභාපතිවරයාට යවා ඇත.

### 1.2. තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පස්සර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

#### (අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණය හිමි ශේෂය රු.13,109,640 ක් වුවද එය රු.13,274,430 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු.7,763,146 ක් වුවද එය රු.6,756,770 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | නිවැරදි කර ගනිමි. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ ආධාර,දායක මුදල් හා සහනාධාර වියදම් රු.67,678 ක් වුවද, මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනයේ රු.28,833 ක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කරමි. |

#### (ආ) විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.105,788,698 ක ඉඩම් හා ගොඩනැඟිලි ශේෂයට අදාල ඔප්පු, තක්සේරු වාර්තා හා ස්ථාවර වත්කම් ලේඛනය විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | සභාව සතු ඉඩම් සඳහා ඔප්පු සහ තක්සේරු වාර්තා නොමැත. |

## 1.4 <u>අනුකූල නොවීම්</u>

**<u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්</u>.**

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | <u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත</u> 127 වගන්තිය | සභා සීමාව තුල වූ සුසාන භූමි 38 ක් සම්බන්ධයෙන් ඔප්පු, පැවරුම් නියෝග හා මැනුම් නියෝග ලබාගෙන නොතිබුණු අතර, ඉඩම් ලේඛනයක්ද පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ඉඩම් ලේඛනයක් පවත්වා ගත යුතුවේ. | මැනුම් කටයුතු කිරිමට හා පැවරුම් නියෝග ලබාගැනිමට කටයුතු කිරිමට බලාපොරොත්තු වෙමි. |
| (ආ) | පළාත් පාලන කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන චක්‍ර ලේඛය | සභාවට අයත් දේපළ වර්ෂ 05 කට වරක්වත් තක්සේරු කළ යුතු වුවද, පස්සර සතිපොල කඩකාමර 20 ක් එලෙස තක්සේරු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුවේ. | තක්සේරු කිරිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරින් නොපැමිණිම නිසා තක්සේරු කටයුතු ප්‍රමාදවී ඇත. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.31,343,960 ක් වූ අතර,ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,069,852 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | <u>2019</u> | | | | <u>2018</u> | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්ත-මේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම | ඇස්ත මේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 528,266 | 521,457 | 413,371 | 108,086 | 319,156 | 521,457 | 338,002 | 183,454 |
| ii. | කුලී | 57,440,840 | 16,342,203 | 11,411,634 | 4,930,569 | 17,096,000 | 9,370,872 | 9,334,372 | 36,500 |
| iii. | වෙනත් ආදායම් | 2,350,000 | 2,932,974 | 1,528,715 | 1,404,259 | 22,781,800 | 3,183,974 | 1,538,552 | 1,645,422 |
| | එකතුව | 60,319,106 | 19,796,634 | 13,353,720 | 6,442,914 | 40,196,956 | 13,076,303 | 11,210,926 | 1,865,376 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------------------------- | -------------------- | -------------------------- |
| (අ) | පස්සර පොදු වෙළඳපල කඩ කාමරවලින් සහ ටෙන්ඩර් කඩ කාමර වලින් සමාලෝචිත වර්ෂය සඳහා අයවිය යුතු යුතු රු.488,569 ක් අය කරගෙන නොතිබුණි. | හිඟ කඩ කාමර කුලී අයකරගත යුතුවේ. | කඩකුලී ඉහළ අගයක්වීම නිසා අයවීම් ප්‍රමාදවී ඇත.අය කර ගැනීම සඳහා වරින්වර කටයුතු කළෙමි. කඩ කුලි සඳහා සාධාරණ විසඳුමක් ලබාදිය යුතුව පවතී. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වසර 05 කට අධික කාලයක සිට අය නොවී පැවැති රු.46,233,837 ක් වූ ණයගැති ශේෂය අය කරගෙන නොතිබුණි. | හිඟ ණය ශේෂ අයකරගත යුතුවේ. | කර්මාන්ත ණයගැති ශේෂ කඩිනමින් අය කරගැනීමට කටයුතු කරමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------------------------------- | ----------------- | ----------------------------- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අය විය යුතුව පැවති උසාවි දඩ රු.23,275,156 ක් සහ හිඟ මුද්දර ගාස්තු රු.6,355,657 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ උසාවි දඩ සහ හිඟ මුද්දර ගාස්තු අය කරගත යුතුවේ. | මේ සඳහා අදාල ආයතන දැනුවත් කර තිබුණද මේ වනතෙක් එම හිඟ මුදල් ලබාදී නොමැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය,පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන්, ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| -------------------------------- | -------------------------------- | --------------- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය අනුව ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 12 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා හෝ වැළඳගෙන හෝ නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවාගෙන නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පස්සර බස් නැවතුම්පළ කඩ කාමර 08 ක මාසික කුලිය 2015 වර්ෂයේදි තක්සේරු දෙපාර්තමේන්තුව මගින් වසර 03 කට බලපැවැත්වෙන ලෙස තක්සේරු කර තිබුණු අතර, නැවත 2019 වර්ෂය සඳහා තක්සේරුවක් සිදු කරවාගෙන නොතිබුණි. | නව තක්සේරුවක් සිදු කරවා ගත යුතුවේ. | තක්සේරු කිරිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත දැනුම්දීම් කර ඇත. |
| (ආ) | 2019 වර්ෂයේදී සභා බල ප්‍රදේශය තුළ සිදුකර තිබුණු අනවසර ඉදිකිරීම් 21 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ප්‍රාදේශිය සභා පනත අනුව කටයුතු කළ යුතුවේ. | නිත්‍යානුකූලව කටයුතු කරන බවට දන්වමි. |
| (ඇ) | සභාවට අයත් ඉඩම් 14 ක අයිතිය තහවුරු කර ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මැනුම්කර පවරා ගැනීමට කටයුතු කරමින් පවති. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම යටතේ ඇති ඉඩම් සම්බන්ධව ඉදිරි කටයුතු කිරීමට නොහැකිව පවති. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වියදම් ණය හිමියෝ රු. 2,330,596 ක් හා කර්මාන්ත ණයහිමියෝ රු.13,274,430 ක් නිරවුල් කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි නිරවුල් කිරිමට කටයුතු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 05 කට අදාල සේවක පුරප්පාඩු 09 ක් පැවතුනි. | අත්‍යාවශ්‍ය සේවක පුරප්පාඩු පිරවිය යුතුවේ. | පුරප්පාඩු සඳහා අදාල ආයතන දැනුවත් කර ඇත. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 නිෂ්ක්‍රීය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් 2014,2015 හා 2016 වර්ෂවල මිලදී ගෙන තිබුණු රු.145,198 ක් වටිනා ටයර් හා ටියුබ් ඒකක 31 ක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුනි. | අවශ්‍යතාවය හඳුනාගෙන මිලදී ගැනීම් සිදුකළ යුතුවේ. | අදහස් දක්වා නොමැත. |

## 4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතුවේ. | අභ්‍යන්තර විගණනයක් සිදු කිරීම සඳහා අභ්‍යන්තර විගණන නිලධාරින් පැමිණ නොමැති බව දන්වා සිටිමි. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | කාර්තුවකට එක් වරක් වන පරිදි විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | 2020 වර්ෂයේදී නිවැරදි කරමි. |